c 891.4851 SUD

# සිංහල සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යයේ ඇතුළත් ලෝක සංකල්පය

නාවලපිටියේ අනුරාධා සුධම්මිකා මෙහෙණිය

UNIVERSITY OF PERADENIYA
28 MAY 2007
ASSISTANT REGISTRAR
FACULTY OF ARTS

දර්ශනපති උපාධි නිබන්ධනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
පේරාදෙණිය.

2000/2001

UNIVERSITY OF PERADENIYA
29 APR 2008
LIBRARY

617382

# සාරාංශය

'සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ ඇතුළත් ලෝක සංකල්පය' නම් වූ මෙම පර්යේෂණ නිබන්ධයෙන් අපේක්ෂා කරනුයේ දිව්‍ය, බ්‍රහ්ම, අපාය යන 'ලෝක' පිළිබඳ සිංහල සාහිත්‍යාගත කරුණු විමසීමයි.

එයට ප්‍රවේශයක් වශයෙන් පළමු පරිච්ඡේයේදී ප්‍රාග්බෞද්ධ යුගයේ පටන් සම්භාව්‍ය සිංහල ගද්‍ය කෘති රචනා වූ පොළොන්නරු යුගය තෙක් 'ලෝක' සංකල්පය ගැන කරුණු සංක්ෂේපයෙන් දැක්වෙයි. මාතෘකාව පෘථුල වීමත් කරුණුවල අධිකත්වයක් නිසා 31 තලයක් ලෙස ඉගැන්වෙන ලෝක ස්වර්ග සහ පතාල යනුවෙන් ප්‍රධාන කොටස් දෙකක් යටතේ සාකච්ඡාවට බඳුන් වේ. මිනිස් ලෝකය පිළිබඳ තොරතුරු අධික නිසා නොපෙනෙන ලෝක ගැන මිනිස් චින්තනයට සමරූපීව සාහිත්‍ය තුළ ගොඩ නැඟී ඇති ආකාරයත් ප්‍රාග් බෞද්ධ අදහස් බෞද්ධ යුගය වන විට නව අර්ථකතන බවට පත් වූ අයුරුත් පිටක ග්‍රන්ථාගත කරුණු පාලි අට්ඨකථා සහ පශ්චාත් අට්ඨකථා ඇසුරින් පුරාණෝක්ති වශයෙන් වර්ධනය වූ ආකාරයත් ජන චින්තනයට ඒවා සංක්‍රමණය වූ අයුරු පළමු පරිච්ඡේදයේ සාකච්ඡා වේ.

දෙවන පරිච්ඡේදයේ දී මෙම පර්යේෂණයට යොදා ගන්නා සම්භාව්‍ය සිංහල ගද්‍ය කෘති හඳුන්වාදීම සිදුවේ. එහිදී එම කෘතිවල කතුවරයා, කාලය, අන්තර්ගතය, රීතිය, භාෂාව සහ ඒවායේ මූලාශ්‍ර මෙන්ම ලෝක සංකල්පය ග්‍රන්ථය හා සම්බන්ධ වන ආකාරය විමසුමට ලක්වේ.

තෙවන පරිච්ඡේදය අනුමාතෘකා දෙකක් යටතේ සාකච්ඡාවට බඳුන් කර ඇත. ස්වර්ග සහ පාතාල ලෝක තල සහ ලෝක වාසීන් ගැන විස්තරාත්මක තොරතුරු ඒකරාශී කර ග්‍රන්ථයෙන් ග්‍රන්ථයට වෙනස්වන ආකාරය හෝ සමානතා මූලාශ්‍ර ඇසුරින් විමසුමට භාජනය කෙරේ.

සිව්වන පරිච්ඡේදයේ දී ස්වර්ග හා පාතාල වැසියන් පිළිබඳ තෝරාගත් සිංහල සම්භාව්‍ය සාහිත්‍ය කෘතිවල සඳහන් ආකාරය විමසුමට ලක් වේ.

දෙවන, තෙවන හා සිව්වන පරිච්ඡේදවලදී මෙම පර්යේෂණය සඳහා යොදාගත් කෘතිවල උපුටා දැක්වීම් යොදන තන්හිම පිටු අංක යොදනු ලැබේ. එමෙන්ම උපුටා ගැනීම්වලදී ඒ ඒ ග්‍රන්ථයන්හි පද බෙදා ඇති අයුරින්ම ඇතුළත් කර ඇත.

පස්වන පරිච්ඡේදය වෙන් වන්නේ සමාලෝචනය සහ නිගමනයටයි.

අනතුරුව මෙම පර්යේෂණය සඳහා ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය දක්වනු ලැබේ.